## හැඳින්වීම

අද්‍යතන ගෝලීය සමාජ සන්දර්භය තුළ ක්‍රියාකාරී මාධ්‍ය සංස්කෘතිය විශාල වෙනසකට බඳුන් කිරීමේ ප්‍රමුඛයා වන්නේ රූපවාහිනී මාධ්‍යයි. මෙම මාධ්‍ය සතු ශ්‍රව්‍යමය හා දෘශ්‍යමය ශක්‍යතාවය නිසා අන් මාධ්‍යයන් අභිබවමින් මිනිස් විඥ්ඥානය ස්පර්ශ කොට සුබයේ ඇඳ බැඳ තබා ගැනීමට තරම් බලවත් වන්නේය.

නූතන ජනමාධ්‍ය බිහිවීමත් සමගම එතෙක් පැවති සම්ප්‍රදායික සමාජ ජීවන ශෛලය තුළ ගැඹුරට විපර්යාසයක් සිදු වන්නට විය. නූතන ජනමාධ්‍ය සමාජීය ආයතනයක් වශයෙන් මෙන්ම ජන ජීවිතයේ අවියෝජනීය කොටසක් බවට පත් වෙමින් සමාජ ජීවිතයේ විවිධ පැතිකඩවල් කෙරෙහි තීරණාත්මක බලපෑමක් කරනවා පමණක් නොව ආධිපත්‍යයක් ද පවත්වාගෙන යනු ලබයි. ලුවී අලිතුසල් විසින් මතවාදී රාජ්‍යය උපකරණයක් ලෙස අර්ථ දක්වන්නෙත් ජෝර්ජ් ගබ්නර් විස්න් "කර්මාන්ත නියමයේ සංස්කෘතික හස්තය" ලෙස අර්ථ දක්වනු ලබන්නෙත් රූපවාහිනී අත්පත්කරගෙන ඇති මෙම ආධිපත්‍ය නිසාවෙනි.

රූපවාහිනිය මුල් යුගයේ විකාශන කටයුතු ජාතික භූගෝලීය සීමාවන්ට සීමා විය. එහෙත් පසුව පුවත්පතකට හා ගුවන් විදුලියට තිබූ භාෂාමය බාධකය ජයගෙන සංස්කෘතීන් හා දේශ සීමාවන් සිසාරා යාමේ තාක්ෂණික හැකියාව රූපවාහිනිය අත්පත් කරගත්තේය. රූපවාහිනිය බිහි වූයේම ගෝලීය මට්ටමේ ග්‍රාහක ප්‍රජාවක් අනාගතයේදී අත්පත්කර ගන්නා මාධ්‍යයක් වශයෙනි. පසුකාලීනව තාක්ෂණය හා ආර්ථිකයේ සිදුවූ වෙනස්කම් නිසා වැඩිකල් නොගොස් ම රූපවාහිනියට එම තත්ත්වය අත්පත්කරගත හැකි විය. තාක්ෂණික වශයෙන් 1990 දශකය වන විට චන්ද්‍රිකා තාක්ෂණය, කේබල් නාලිකා ක්‍රමය, අන්තර්ජාලය යන තාක්ෂණ ක්‍රමයන් හි දායකත්වය රූපවාහිනිව විසින් අත්පත් කර ගන්නා ලදි. චන්ද්‍රිකා තාක්ෂණය සංකේතවත් කරන්නේම පෘතුවි ගෝලයේ කරන්නා වූ සන්නිවේදන තාක්ෂණයක මහේක්ෂභාවයයි.

Satellite TV - A Television System in which the single is transmitted to any orbitny satellite that receives the signal amplifies it and transmit back to earth(http/en.wikipedia, org/ wiki/satellite_television).

චන්ද්‍රිකා රූපවාහිනී ක්‍රමවේදය ලෝකය පුරා ඉක්මනින් ව්‍යාප්ත වන්නට විය. විශේෂයෙන් ම මේ හරහා පෘතුවි තලයේ ස්ථාන හා මිනිසුන් තාක්ෂණයකින් යා කළ හැකි සන්නිවේදන ගෝලියත්වයක් නිර්මාණ කළ හැකි විය. ඒ නිසා ම මෙය ඉතාමත් ජනප්‍රිය රූපවාහිනී ක්‍රමවේදයකි. සමාජ සංස්කෘතික වශයෙන් එකට යා කළ හැකි සමාජ සන්දර්භයක් මේ හරහා ගොඩ නැගිය හැකිය.

මෙම රූපවාහිනී ක්‍රමවේදය ලෝකය පුරා ඉක්මනින් ව්‍යාප්ත වුවත් ලංකාව තුළට මෙම රූපවාහිනියේ ආගමනය සිදු වන්නේ මෑත කාලයේදී නිත්‍යානුකූල ලෙස ලංකාවේ චන්ද්‍රිකා රූපවාහිනියක් මුලින්ම ස්ථාපිත වන්නේ 2005 මැයි 27 දින CBN Sat චන්ද්‍රිකා රූපවාහිනිය ස්ථාපිත කිරිමත් සමගය. මෙම සේවාව ලංකාව පුරා ඉතාමත් ඉක්මනින් ව්‍යාප්ත වුවත් 2006 ජුනි 6 දින වන විට මෙම සේවාව අත්හිටවනු ලබයි. ඔවුන්ට එල්ලවන ප්‍රධාන චෝදනාව වන්නේ LTTE නාලිකාවන් අවසරයකින් තොරව Free to Air ග්‍රහකයින් වෙත විකාශනය කිරිමයි. නමුත් ඔවුන්ට එල්ල කරනු ලබන චෝදනා ඔප්පු කිරීමට අපරාධ විමර්ශන ඒකකයට හැකියාව ලැබෙන්නේ නැත. කෙසේ වෙතත් මෙම තත්ත්වය මත CBN Sat ආයතනය අඩාල වන අතර එහි හිමිකාරත්වය Dialog Telecom ආයතනය විසින් 2007 මස සිට අත්පත් කරගනී (http/en.wikipedia, org/wiki/Dialog_tv).

ලංකාව තුළ නිත්‍යානුකූල ලෙස ස්ථාපිත නොවූ ඉන්දියාව තුළින් Uplink කරනු ලබන වැඩසටහන් ද නැරඹීමට හැකියාවට ඇත. වර්තමානය වන විට මෙය මෙරට විශාල ව්‍යාපාරයක් බවට පත්ව ඇත. Dish හා Receiver මෙරටට ගෙන්වීමේ විශාල පරිමාණ ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යනු ලබයි. ඒවා හරහා වඩාත් ම ප්‍රයෝජන ලබා ගන්නේ ලංකාවේ දෙමළ, මුස්ලිම් ප්‍රජාවයි. විශේෂයෙන් ම එමගින් මිලෙහි පවතින ලාභදායි බවත් විශාල විදේශ නාලිකා ප්‍රමාණයක් නැරඹීමට ඇති හැකියාවත් නිසා මෙම සේවාවන් භාවිතයට පෙළඹේ.

යම් මාධ්‍යයක් රටක ස්ථාපිත කිරීමෙදි එය එරට සමාජ, ආර්ථික, සංස්කෘතික රටාවට ගැලපිය යුතුය. විශේෂයෙන් ම එය එරට සමස්ත ජනතාවම නියෝජනය කරන්නක් විය යුතුය. නමුත් මෙරට ජනමාධ්‍ය ආරම්භය පටන් ම එනම් පුවත්පත, ගුවන් විදුලි, රූපවාහිනී ආදි සෑම මාධ්‍යයක් ම සමස්තයක් ලෙස ක්‍රියා කර ඇත්තේ සිංහල මතවාදයට උලුප්පා දැක්වීමකි.

මෙහිදි 1973 දී හබර්මාස් විසින් ඉදිරිපත් කරන ලද මහජන ගෝලය, (Public Sdpear) නැමැති සංකල්පය ඉතා වැදගත් වේ. ඒ තුළ ඔහු ප්‍රකාශ කර සිටින්නේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුද්ගලයන්ම ඒවායේ තින්දු, තීරණ, නිගමන වලට පැමිණීමට ඇති අවකාශයයි(Habermas, 1989). නමුත් ලංකාව තුළ මෙවැනි පොදු මහජන ගෝලයක් දක්නට ලැබෙන්නේ නැත. විශේෂයෙන් ම වාර්ගිකත්වය , තුළ දුප්පත් පොහොසත් ආදී වශයෙන් හමු නොවන සමාජයක අප ජීවත් වේ. මෙම තත්ත්වය ඇති කරනු ලබන්නෙත් මාධ්‍යය හරහාය.

එ නිසාම ලංකේය සමාජය තුළ මෙම වාර්ගිකත්වය හා මාධ්‍ය අතර ඇත්තේ දෛලෙක්තික ස්වභාවයකි. මෙම තත්ත්වය තුළ අපට පැහැදිලි වන ප්‍රධාන කරුණක් වන්නේ මෙරට සුළු ජනවර්ග වලට ගැලපෙන මාධ්‍ය සංස්කෘතියක් නොමැති බවය. ඒ හරහා වාර්ගිකරණය වූ හිස් අවකාශයක් නිර්මාණයක් වේ. මෙම හිස් අවකාශයේ ඌන පූර්ණයන් සඳහා මෙරට ජනතාව විවිධ විකල්ප කරා යොමු වේ.

එලෙස මෙරට සුළු ජනවර්ග තුළ ඇති මාධ්‍ය රික්තය පිරවීමට ඔවුන් වැඩි වශයෙන් චන්ද්‍රිකා රූපවාහිනී කෙරෙහි යොමු වී ඇතැයි යන උපකල්පනය මත පිහිටා මෙම පර්යේෂණයේ සිදු කරනු ලබයි. එහිදි විශේෂයෙන් මෙරට සුළු ජනවර්ග තුළ චන්ද්‍රිකා රූපවාහිනී කෙරෙහි සිංහල ජනවර්ග තුළ චන්ද්‍රිකා රූපවාහිනී කෙරෙහි සිංහල ජනවර්ග වලට වඩා වැඩි අවධානයක් තිබේ දැයි සොයා බලා එයට බලපාන හේතු විමර්ශනය කිරීම මෙහිදි අපේක්ෂිතය.

ලංකාවේ සුළු ජනවර්ග වල චන්ද්‍රිකා රූපවාහිනී කෙරෙහි පෙළඹීමේ වර්ධනයක් ඇතැයි යන මතය මෙතෙක් කලක් පැවතියේ නිරීක්ෂණ මට්ටමින් තහවුරු කරගත් කරුණු පමණි. එය දත්ත සහිතව ඔප්පු කිරීමක් මා දන්නා තරමින් මෙතෙක් සිදු වී නොමැත. එබැවින් චන්ද්‍රිකා රූපවාහිනී ග්‍රාහකත්වය පිළිබඳ කරන ලද පර්යේෂණ වලින් ඔබ්බට යමින් ඉහත සඳහන් කළ කරුනු සනාථ කිරීමට උත්සහ දැරීම මාගේ පර්යේෂණයේ අරමුණ වේ.